20



# සීරාවෙහි වැදගත්කම



"සීරා" මුහම්මද් නබි (සල්) තුමාගේ ජීවිත කතාව ගැන කීමට භාවිත වන තනි වචනයකි. මෙම වචනය පදනම් කොටගෙන සීරාව කලාවක් ලෙස ප්‍රගුණ කොට, ලේඛන ගත වෙමින් පවතී.

මුහම්මද් නබි (සල්) තුමා සියලු දෙනාට ම පොදු යහ මග පෙන්නුම් කළ කෙනෙකි. නබි තුමනි, අප ඔබව මෙලොව සිටින සියලු මනුෂ්‍ය වර්ගයාට ම අවවාද කර අනුශාසනා කරන ලෙස මෙලොවට යවා ඇත. එහෙත් තවම බහුතරයක් ජනතාව මේ පිළිබඳව අනවබෝධයෙන් සිටිති (34:28) යනුවෙන් අල් කුර්ආනය විදහා දක්වයි.

තව ද අල්ලාහ් (රබ්බු) සර්ව බලධාරියා වශයෙන් (1:1) සිටිනවා මෙන් ම නබි (සල්) තුමා (රහ්මතන් ලිල් ආලමීන්) සර්ව දූතයා වශයෙන් (21:07) සිටින්නේ ය. අල්ලාහ් (රබ්බුන්නාස්) මනුෂ්‍යයන්ගේ ස්වාමියා වශයෙන් (114:1) සිටිනවා සේ ම නබි (සල්) තුමා (කාෆ්ෆතුන් ලින්නාස්) මුළු මහත් මනුෂ්‍ය සමාජයටම නබි වශයෙන් (34:28) සිටින්නේ ය. එම නිසා පසු ගිය සියවස් දාහතරකටත් අධික කාලයක් තිස්සේ එතුමාගේ සීරාව ඉගෙන ගෙන ආරක්ෂා කරනු ලැබිණි. මෙයට හේතු වූ කරුණු කීපයක් සඳහන් කළ හැකි ය.

1. ඔහු මෙලොවේ අවසාන දූතයා වෙයි. එතුමාගෙන් පසු වෙනත් දූතයකු බිහි වන්නේ නැත. එම නිසා එතුමාගේ පණිවිඩය ආරක්ෂා කළ යුතු වෙයි.

2. එතුමාව පිළිගෙන තම ජීවන රටාව හසුරුවා ගත් ජනතාව එතුමාගේ කාලයේ සිට අද දක්වා පැවත ඒම.

3. එතුමාගේ ඉතිහාසය නිවැරදි ව ලියා ආරක්ෂා කරගෙන ඒම සෑම කල්හි දී ම එතුමාගේ චරිතයට හානියක් නොවන අන්දමට ආරක්ෂා කිරීමට උත්සාහ දැරීම.

4. එතුමාගේ ජීවිත කථාව පිළිබඳ පොත්, සියලු ම භාෂා වලින් මුස්ලිම් ජනතාව පමණක් නොව මුස්ලිම් නොවන පුද්ගලයින් විසින් ද විවිධ කෝනවලින් ලියා තිබීම.




නබි(සල්) තුමාගේ සීරාව ව්‍යාකූල නොවේ. එතුමා ජීවත් වන කාලයේ දී සහාබාවරුන් විසින් එතුමාගේ ප්‍රතිරූපය, චලනය, දේශනය, ක්‍රියාකාරකම්, කැමත්ත, අකමැත්ත යනාදිය ඉතා සූක්ෂම ලෙස හඳුනා ගනු ලැබිණි. පසු කාලීන ව ජනතාව ඒවා සාක්ෂි සහිතව ඔප්පු කළෝ ය. එතුමාගේ ජීවිතය පිළිබඳ තොරතුරු සෙවීමට ඉදිරිපත් වූහ. ගෙයින් ගෙට ගොස් සජීවී ව දුටු අයගෙන් අසා දැනගත්තෝ ය. ඒ දැන ගත් තොරතුරු නැවත විමර්ශනයට ලක් කළෝ ය.

නබි (සල්) තුමාගේ මිතුරන්, තාබිඊන්වරු, ඉන් පසු තබඋත්තාබිඊන්වරු, නබි තුමාගේ ඉතිහාසය ආරක්ෂා කිරීම සඳහා අසහාය උත්සහයක යෙදුනෝ ය. එම නිසා නබි (සල්) තුමා ජීවත් වන කාලයේ ජනතාව එතුමාගේ ක්‍රියාකලාපය දුටුවා සේ ම අපටත් එතුමාගේ සීරා ව කියවීමෙන් එම ක්‍රියා පිළිබඳ සිතින් දැක ගත හැකි වන අයුරින් එම සීරාව ගොනු කොට ඇත. ශ්‍රවණය කිරීමෙන් සහ කටපාඩමෙන් ලැබුණු සීරා තොරතුරු මුහම්මද් බින් ඉස්හාක් (හිජ්රි 151) දී ප්‍රථමයෙන් ලේඛන ගත කළේ ය.

එහි නම සීරත් රසූලුල්ලාහ් යනුවෙන් හැඳින්විනි. එම ග්‍රන්ථය පසුකාලීන ව නොලැබුණි ඉන්පසු එම ග්‍රන්ථය සමගාමී ව මුහම්මද් අබ්දුල් මලික් බින් හිෂාම් (හිජ්රි 218) විසින් ලියන ලද ග්‍රන්ථය දැනටත් තිබෙන අතර සීරාවට ලියන ලද ප්‍රථම ග්‍රන්ථ දෙක වශයෙන් මෙම ග්‍රන්ථ දෙක සැලකේ. නබි (සල්) තුමා තම සීරාව වැරදි අන්දමට හඳුන්වාදීම නොකළ යුතු යැයි තම මිතුරන්ට තරයේ අවවාද කළේ ය. කෙනකු මා ගැන බොරුවක් ගොතන්නේ ද ඔහු ඔහුගේ වාසස්ථානය අපායේ සොයා ගනු ඇත. (බුහාරි) මරියම්ගේ පුතා ඊසා (අලෛ) තුමාට ව්‍යාජ ලෙස ප්‍රශංසා කරනවා සේ ම කරන්න එපා යැයි කීහ. මම දූතයෙක් පමණයි. මා අල්ලාහ්ගේ දූතයෙක් යැයි පවසන්න (බුහාරි) එම නිසා එතුමාගේ සීරාව නිවැරදි ව, පිරිසිදු ව ලියා තිබේ. කියවීමෙන්, දේශන කිරීමෙන්, ක්‍රියාවට නැංවී තිබේ.

එනමුත් නබි (සල්) තුමා අප මෙන් සාමාන්‍ය මිනිසකු යැයි පැවසිය නොහැකි ය. ඔහු මිනිසුන් අතර ඇති ශුද්ධ වූ මිනිසෙකි. පෙර පසු පව්වලට සමාව දෙන ලද කෙනකු වශයෙන් මෙන් ම ද විවිධ යහපත් ගතිගුණ හිමි පුද්ගලයෙක් වශයෙන් ද ඔහු උසස් වේ. මුස්ලිම් වරයකු වශයෙන් එතුමාට සමීප වීම ඊමානයේ කොටසක් වෙයි. මුස්ලිම් අයට එතුමා තම පණටත් වඩා වැදගත් කෙනකි. (33:6)

'විශ්වාසවන්තයිනි ! ඔබ තුළින් නිශ්චිතව ම (අපගේ) දූතයෙක් පැමිණ සිටියි. (ඔබට යම් කරදරයක් සිදු වී) ඔබ දුකට පත් වූ විට (එය) එතුමාගේ සිත් තැවුලට හේතු වෙයි.

ඒ තරමට ඔහු ඔබ සමග සුහදශීලී ය.) ඒ අතර ම ඔහු ඔබගේ ආනිශංස නිතර ම ප්‍රිය කරන කෙනකු වන අතර මනා විශ්වාසවන්තයින් වන ඔබ කෙරෙහි දයාව හා කරුණාව ඉමහත් ලෙස ඔහු තුළ ඇත.' (9:128)

'කවුරු හෝ කෙනෙක් ඔහුව විශ්වාස කර එතුමා ශක්තිමත් කර එතුමාට උදවු කර එතුමන් හට පහළ වූ ප්‍රභාන්විත ධර්මය පිළිපදින්නේ ද ඔහු සමත් වූ වෙකි වැනි අල් කුර්ආන් වැකි අප හා එතුමන් අතර ඇති සබඳතා ව පැහැදිලි කරයි. එම නිසා 'ඔහුගේ ජීවන රටාව ඉගෙන ගැනීම අවශ්‍ය වෙයි. එලෙස අධ්‍යයනය කිරීමේ දී සෙබලා සෙන්පතියා ව, ශිෂ්‍යයා ගුරුවරයා ව, අනුගාමිකයා නායකයා ව අනුගමනය කරනවා සේ ම සීරාව ඉගෙන ගත යුතු අතර ම එහි වැදගත්කම හඳුනාගෙන මධ්‍යස්ථ ජීවිතයක් අනුගමනය කළ යුතු යැයි මුහම්මද් අල් ගස්සාලි සඳහන් කළේ ය.




මිනිසුන් සියලු දෙනා ම එක සමාන ව සිටියත් ඔවුන්ගේ ගති ගුණ හැකියා අරමුණු ක්‍රියාකාරකම් වෙනස් වෙයි. එනමුත් ඔවුන් සියලු දෙනා සඳහා ම වූ ආදර්ශය සීරාවේ සඳහන් වෙයි.

'සත්‍යවශයෙන් ම අල්ලාහ්ගේ දූතයා වෙතින් ආදර්ශයක් ඇත.' (33:21) යනුවෙන් අල් කුර්ආනයේ සඳහන් වෙයි. එම ආදර්ශය නිශ්චිත කාලයකට හෝ ස්ථානයකට හො ජාතියකට හෝ සිමා නොකර සියලු දෙනා ම අනුගමනය කළ හැකි ය.

'දුප්පතකු වුව ද පාලකයකු හෝ පාලනය වන කෙනකු වුවද ඉගෙන ගන්නකු හෝ ජයග්‍රාහකයකු හෝ දුකෙන් සිටින්නකු හෝ කරදර වලට ලක් වූ කෙනකු හෝ වෙනයම් ජීවන රටාවක් අනුගමනය කරන කෙනකු වුව ද සියලුම දෙනාට ආදර්ශයක් වන ජීවන රටාවක් සීරාවේ දක්නට තිබෙන බව සෙයියද් සුලෙයිමාන් නද්වි සඳහන් කළේ ය.

එම නිසා සීරාව විවෘත හදවතින් ඉගෙන ගත් අය එයට යොමු වී නබි (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා යනුවෙන් පිළිගෙන විශ්වාසවන්තයන් බවට වෙනස් වූ සමහරු ගැන ඉතිහාසයේ සඳහන් වෙයි.

තවත් දෘෂ්ටි කෝණයකින් බලන විට සීරාව ඉස්ලාමයේ මූලික සිද්ධාන්තවල එක් මාධ්‍යයක් වෙයි. අල් කුර්ආනය හෝ වේවා සුන්නාව හෝ වේවා අපට ලබාදුන්නේ නබි (සල්) තුමාණන් ය. අල්ලාහ් ජිබ්රීල් (අලෛ) මගින් අල් කුර්ආනය පිළිගැන්වී ය. එය හා නබි (සල්) තුමාගේ ජීවිතය සම විය. මේ දෙක මුල් කර ගෙන ඉස්ලාමීය ජීවන ක්‍රමය හැඩ ගැසී ඇත. ඒ අනුව, මිනිසුන් නොමග යෑම වැළැක්වීම සඳහා අල් කුර්ආනය හා සුන්නාව යන දෙක ම මෙලොවට දයාද කර යන බව නබි (සල්) තුමා තම අවසන් දේශනයේ දී පැවසුවේ ය. එම නිසා ඉස්ලාමීය ජීවන රටාවේ සීරාව වැදගත් තැනක් උසුලන බව සඳහන් කළ හැකි ය.

අන් අයගේ ජීවිත මරණයෙන් අවසන් වන නමුත් නබි (සල්) තුමාගේ ජීවිතයට අදටත් පැවැත්මක් ඇත.

**අභ්‍යාස**

1. පහත සඳහන් අරාබි වචනවල තේරුම දෙන්න.

| | |
|---|---|
| සීරා | රබ්බුල්ආලමීන් |
| සහාබා | රහුමතන් ලිල් ආලමීන් |
| තාබිඊන් | තබඋත්තාබීඊන් |
| කාෆ්ෆාතුන් ලින්නාස් | රබ්බුන්නාස් |

2. නබි (සල්) තුමාගේ සීරා සියලු ම ජනතාවට යෝග්‍යයි, යන කාරණාව හේතු සහිත ව දක්වන්න.

3. නබි (සල්) තුමාගේ සීරාව ව්‍යාකූල නොවී තිබීමට යොදා ගත් සාධක වගු ගත කරන්න.

4. සීරාව ඉගෙන ගත යුත්තේ ඇයි දැයි කෙටියෙන් සඳහන් කරන්න.

5. ඔබ දැනගත් සීරා ග්‍රන්ථවල නාම ලේඛනයක් සකස් කරන්න.